UNIVERSITY OF PERADENIYA

CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 100 මට්ටම - 2022**

**கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி–புதிய பாடத்திட்டம்) 100 வது தேர்ச்சி மட்டம் – 2022**

**Bachelor of Arts (External - New Syllabus) Examination 100 Level - 2022**

ලේඛන කුසලතා හා සිංහල ශාස්ත්‍රීය ලේඛනය

**SUPE 105**

කාලය පැය**(03)** තුනයි.
மூன்று(03) மணித்தியாலங்கள்.
Time three **(03)** Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Marks will be deducted for illegible hand writing.

අභිමත ප්‍රශ්න 05ට පමණක් පිළිතුරු සපයන්න.
------ வினாக்களுக்கு மட்டும் விடையளிக்க.
Answer ------ questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 08කි.
இந்த வினாப்பத்திரத்தில் ------ வினாக்கள் உள்ளன.
There are ------- questions in the question paper.

---

01. "ශාස්ත්‍රීය ලේඛනය විග්‍රහාත්මක, විමර්ශනාත්මක හා විශිෂ්ට භාෂා ව්‍යවහාරයකින් යුතු සාර සංග්‍රහයකි.", ශාස්ත්‍රීය ලේඛනයේ ස්වභාවය පැහැදිලි කරමින් ඉහත කියමනට පක්ෂ ව හෝ විපක්ෂ ව හෝ කරුණු දක්වන්න.

02. අධ්‍යයන ක්‍රියාවලියේ දී සාරග්‍රහණ (skimming) සහ පරිලෝකන (scanning) යන ක්‍රමවේද අනුගමනය කළ යුත්තේ කවර නිසාදැ'යි එ කී සංකල්ප පැහැදිලි කරමින් කරුණු දක්වන්න.

03. දේශනයක/කියවීමක මුඛ්‍ය අදහස් ලේඛනගත කිරීමේ (note taking) උපක්‍රම සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

04. ශාස්ත්‍රීය පර්යේෂණයකට/ව්‍යාපෘතියකට 'සමාප්ති වාර්තාවක්' සකසන අයුරු පහදන්න.

05. "ශාස්ත්‍රීය ලේඛනය භාෂාමය සංදිග්ධතාවෙන් තොරවිය යුතු ය.", උචිත නිදසුන් ඇසුරින් පහදන්න.

06. සිංහලයේ පද බෙදීමේ නීතිරීති 'සිංහල ලේඛන රීතියට' අනුව හෝ අභිමත රීතියක් ඇසුරින් පහදන්න.

07. ශාස්ත්‍රීය පර්යේෂණ යෝජනාවලියක/ව්‍යාපෘති වර්තාවක අන්තර්ගත විය යුතු මූලික කරුණු නිදසුන් ඇසුරින් පහදන්න.

08. **එක්කෝ**

ශාස්ත්‍රීය ලේඛනයේ දී සිංහල භාෂාවේ න,ණ,ල,ළ භේදය කෙරෙහි ලේඛකයා සැලකිලිමත් විය යුත්තේ කවර නිසාදැ'යි පහදන්න.

**නැතහොත්**

පද සාධනයේ දී ආධුනිකයන් අතින් බහුල ව සිදුවන සාවද්‍යතා වෙතොත්, ඒවා නිවැරදි වහර දක්වමින් පහදන්න.

(සැම පිළිතුරකටම ලකුණු 20 බැගිනි).